## *සිංහල භාෂාව හා සාහිත්‍ය තරග 2024 (කලාප)*

අපේක්ෂකයාගේ නම :- ..............................................................................

(මුලකුරු සමග නම)

පාසලේ නම :- ..............................................................................

පාසල් වර්ගය :- 200 ට අඩු / 201 - 500 / 501 ට වැඩි

කොට්ඨාසය :- ..............................................................................

කලාපය :- ..............................................................................

## සාහිත්‍ය දැනුම මිනුම

කාලය පැය 03

12 /13 ශ්‍රේණිය

මුළු ලකුණ 100

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1). පහත සඳහන් කවියේ තේරුම ලියන්න.

සුරත ඔහු යුදය ට
සුරත ලෙළදෙන කග පට
සුරත මිස යුග දි ට
සුරත නම් කොද රුපඹුවන් හට

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

(ලකුණ 10)

2). පහත සඳහන් ගද්‍ය පාඨය ලිහිල් බසින් ලියන්න.

'මහණ ගොයුමාණෙනි, සරලුවක් පමණ කැඳ වේව යි, සැන්දක් පමණ බත් වේව යි, අන් කිසිවක් වේව යි, තොපට වේව යි තොපගේ සවුවන්ට වේව යි දන් නොදී පේත් නො ව බණත් නො අසා හුදක් තොප කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් දෙව්ලොව ඉපැදි දිව්‍ය සම්පත් ලබන්නෝ ඇත්දැ'යි විචාළහ. බුදු රජුන් වහන්සේ ඒ අසා වදාරා 'බමුණ, **හඳුනන මඟ යෙමින් සිට මං විචාරන්නා සේ** මා අතින් කුමක් නිසා විචාරයි ද? තාගේ පුත් මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත් පහදවා එ පමණකින් තමා දිව්‍ය සම්පත් ලත් නියාව තට කීයේ වේ දැ'යි තමන් වහන්සේ දිව කනින් අසා වදාළ කටයුත්ත බමුණාණන්ට වදාළ සේක.

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

(ලකුණ 10)

3). පහත සඳහන් පද්‍ය පන්තිය රසවින්දනයක් කරන්න.

සුදට සුදේ මහ ගොඩක් වලාකුළු තරු යට අහසේ දිව යන්නේ
කවුරුද අක්කේ මේවා හදන්නේ කොහෙ තිබිල ද මේ හැටි එන්නේ

මල්ලි දන්නවද පුංචි පුංචි දෙව් කුමරියන් පොඩි මල් ගොතලා
යනවා නොවැ මේ බුදු හාමුදුරුවෝ දැකල එන්න රෑ බණ අහලා

වලාකුළේ අර අයිනේ ලස්සන හිනා මුහුණු පෙනෙනව ළපටි
අක්කෙ බලන්නකෝ ඈත දැකලා ඇති බුදු හාමුදුරුවෝ වඩින හැටි

බුදු හාමුදුරුවෝ සොයා ගන්න බෑ වන දෙව් කුමරියො දුක් වෙනවා
සමනල කන්දේ සිරිපා ඉඹ ඉඹ තාමත් එහෙ මෙහෙ ඇවිදිනවා

ඉතින් අම්මලා නැතිව මොකද මේ තනියම යන්නේ උඩ අහසේ
මටත් යන්න හරි ආසයි අක්කේ වලාකුළක් මත නැග රහසේ

මල්ලි දන්නෙ නෑ කුමාරියන්ගේ අම්මලාගේ ආදරේ පිරිලා
හුළං රැලක් වී යනවා යනවා පරිස්සමට වටටම එතිලා

වෙසක් පෝයදා හුළඟක් වෙන්නට අම්මට කියනවා හඳ පානේ
වලාකුළක් උඩ මාත් නැඟීලා යනවා හැම තරුවක් ගානේ

එතකොට මල්ලිට වෙහෙරක් ගානෙම හඳ එළියේ රන් කොත දැකලා
හඳට යටින් රිංගාගෙන යත හැකි ඔළුව නමාගෙන පහත් වෙලා

(ලකුණු 20)

4). පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පදමට වෙරළු මිණිකැට සුණු විසුළ හැඩ
ජෝතිය ලැගුම්ගත් ළා තන පිටිය උඩ
නැහැ පුඩු මහත් කොට මී ගොන් මුළුව නැඩ
කිම්දෙති නැවුම් පුස්ඹෙහි වෙල් කුඹුරු බඩ

ඇළ දොළ ගලා බස්වන්නට ඉවුරු කඩා
ගොඩ බිම නිවා සනසන්නට සියලු විඩා
ගණ වැහි වලා ඉගිලී එන විට දි අඬා
මට මහා සොම්නසක් ඈත මොණරකුට වඩා

වැසි බිඳු ඇද වැටී කුර ගැටෙන හඬ දිදී
මිදුලේ රළ බැඳෙයි පෙන බුබුළු බිඳී
සුළඟින් ගසා ගෙන එන මිහිරි බව රැඳී
සිතුවිලි වලට මුළු හදවතම ඉඩ මදී

වෙහෙසට පත්ව වට වැසි බිඳු පොකුරු ගිල
දියවැල් වමාරන්නා මෙනි, පියසි තල
මිදලේ පුංචි ගංගාවල් ගලන කල
පාසැල් ළමෝ පාවෙති සිය සිහින වල

නැති වළ ගෙඩැලි මතුකොට ගල් කැට බේරා
පටු මාවතේ දුහුවිලි කොළ රොඩු සූරා
දෙපසෙහි සැදි අගල් සුළි නැගි නැගි හාරා
පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය දාරා

ගසුවැල් තිගැස්සෙයි මේ කුළු ගැටෙන හඬින්
කඳුගැට වසා විහිදෙයි වැහි ගිලිය ගොඩින්
නිකෙලස් හැඟීමක් ඩැහැගත් වන ම තුඩින්
හදවත පියාඹා යයි වෙල් කුඹුරු උඩින්

1. කවියාගේ සිතේ දැඩි සතුටක් ඇති වී ඇත්තේ කුමක් නිසා ද?

.............................................................................................................................................................

2. පද්‍ය පන්තියේ ඇතුළත් උපමාවක් උපුටා දක්වන්න.

.............................................................................................................................................................

3. පියසිතල වෙහෙසට පත්ව ඇත්තේ ඇයි?

.............................................................................................................................................................

4. "වෙරළු මිණිකැට" යන්නෙහි අරුත කුමක් ද?

.............................................................................................................................................................

5. පාසල් ළමුන් සිය සිහිනවල පාවෙන්නේ කුමන කරුණක් නිසා ද?

.............................................................................................................................................................

(ලකුණු 10)

5). පහත සඳහන් වචන වල තේරුම ලියන්න.

1. අමන - ................................ 6. හතරවටින් - ..............................

2. විමාන - ................................ 7. සෙනේදම - ..............................

3. ලෝකත - ................................ 8. බිජුවටක් - ..............................

4. වා මඬලින් - ................................ 9. දදය - ..............................

5. මී සුණු - ................................ 10. සරසවි - ..............................

(ලකුණු 10)

6). කතුවරයා සතු භාෂාව හැසිරවීමේ දක්ෂතාවය නිසාම බැද්දේගම සාර්ථක නවකතාවක් විය. කරුණු සහිතව විමසන්න.

(ලකුණු 15)

7). "ළමයින්ගේ ක්‍රියාකාරකම් හා හැඟීම් ගැන අපූරු විග්‍රහයක් "වෙසක් පහන" කෙටිකතාව තුළින් කියාපායි." විමසන්න.

(ලකුණු 15)

8). පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

I. ජී.බී. සේනානායක II. සද්ධර්මරත්නාවලිය

III. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි IV පන්සියපනස් ජාතක පොත

(ලකුණු 10)